අ.පො.ස. සාමාන්‍ය අපෙළ විභාගය - 2019
සිංහල භාෂාව හා සාහිත්‍ය - I පත්‍රය
පිළිතුරු පත්‍රය

ප්‍රශ්න අංකය		පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය		පිළිතුරු
1.	-	3	21.	-	4
2.	-	1	22.	-	3
3.	-	4	23.	-	1
4.	-	1	24.	-	2
5.	-	1	25.	-	3
6.	-	3	26.	-	4
7.	-	2	27.	-	3
8.	-	1	28.	-	2
9.	-	4	29.	-	3
10.	-	4	30.	-	1
11.	-	3	31.	-	2
12.	-	4	32.	-	1
13.	-	1	33.	-	4
14.	-	3	34.	-	2
15.	-	2	35.	-	3
16.	-	4	36.	-	1
17.	-	4	37.	-	4
18.	-	1	38.	-	3
19.	-	2	39.	-	2
20.	-	2	40.	-	4

සිංහල භාෂාව හා සාහිත්‍ය
II පත්‍රය - පිළිතුරු.

(1).

(i). (අ) ඩ, ඳ, ණ, න, ම
(ආ) ය, ර, ල, ව

(ii). ධාරානිපාත, ඔරපතළ

(iii). ඉමහත් (ඉ+මහත්)
ප්‍රතිවාර - (ප්‍රති + වාර)

(iv). (අ) සර්වතොභද්‍ර
(ආ) ඒකාග්‍රතාව

(v). (අ) ආශීර්වාද ක්‍රියා/ප්‍රාර්ථනා ක්‍රියා/ආඥ කිරිය
(ආ) විධි ක්‍රියා

(vi). නරපතියාණෙන් - ආණ
මිණිමුවා - මුවා
තද්ධිතය පමණක් ලියා තිබීම ද ප්‍රමාණවත් ය. නද්ධිතය සහිත පදය ලියා තිබුණත් ලකුණු දෙන්න.

(vii).

විසන්ධිය	සන්ධි වර්ගය
පුර + ඉදු	පූර්ව ස්වර ලෝප සන්ධිය
වී + අවුල්	ආගම සන්ධිය

(viii). (අ) සඳ මඩල / චන්ද්‍ර මණ්ඩල
(ආ) මවුබස / මාතෘ භාෂාව

(ix). (අ) ප්‍රේක්ෂකයන් නාට්‍ය ශාලාවේ අසුන් ගෙන ඇත.
(ආ) ගුරුවරු සිසුන් කැටුව පොත් ප්‍රදර්ශනයට සහභාගි වූහ.

(x). (අ) පන්නම
(ආ) නාමබුව

(ලකුණු 02 x 10 = 20 යි)

(2). රචනාව

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි
01. සංවර්ණාවය, මානෘකාව ද ඇතුළුව - ලකුණු 08 යි.
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි
03. ශිල්පීය දක්ෂතා සහ භේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

(3). සාරාංශකරණය:

අන්තර්ගතය

i. පණිවුඩයක් යම් මාධ්‍යයක් මගින් අපූර්වස්වරූපයෙන් ප්‍රකාශ කිරීමට නිර්මාණාත්මක සන්නිවේදනය උපයෝගී වන බව
ii. සන්නිවේදනය කිරීමේදී විවිධ මාධ්‍ය උපයෝගී කරගන්නා බව
iii. ග්‍රාහකයාගේ අවධානයට ලක්වීමක්, යහපත් ප්‍රතිචාර ලබා ගැනීමත් මූලික අපේක්ෂා අතරට ගැනෙන බව
iv. නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ හඳුනා ගැනීමට ජනශ්‍රැති වැදගත්වන බව
v. නිර්මාණාත්මක සන්නිවේදනය සමාජ ප්‍රගමනයට හේතුවන බව
vi. ජනශ්‍රැතියෙන් තොර නිර්මාණාත්මක සන්නිවේදනය නොමැති බව

(මුළු ලකුණු ප්‍රමාණය 10 යි.)

ලකුණු ලැබෙන පිළිවෙළ :

01. අන්තර්ගතය	-	ලකුණු 06යි
02. වචන ගණන	-	ලකුණු 02යි
03. ශිල්පීය දක්ෂතා	-	ලකුණු 02යි

(4).

(i). එකම භාෂාවක් කතා කරන මවුපියන්ගෙන් හෝ වැඩිහිටි සහෝදර සහෝදරියන්ගෙන් හෝ වෙනත් අයගේ කතාවට ඇහුන්කන් දීමෙන්

(ii). භාෂා ස්වීකරණය

(iii). භාෂාව ග්‍රහණය කරන්නා වූ අයට ඇසෙන්නේ ශබ්ද පමණකි. එම ශබ්ද යෙදෙන ආකාරය විශ්ලේෂණය කොට ක්‍රමවත් පද්ධතියක් මනස තුළ ඔවුන් වර්ධනය කරගන්නේ අභ්‍යන්තර ශක්තිය නිසා ය.

(iv). භාෂා හා සම්බන්ධ ආර්ථ වටහා ගැනීමට හා අභිනවයෙන් වාක්‍ය නිපදවීමට අවශ්‍ය ශක්තිය

(v). (අ) අනායාසය
(ආ) ශ්‍රාවකයා

(එක් කොටසකට ලකුණු 2 බැගින් ලකුණු 10)

(5). ලකුණු ලැබෙන පිළිවෙළ :

1. ආකෘතිය - 04
2. අන්තර්ගතය - 08
3. ශිල්පීය දක්ෂතා - 03

(ලකුණු 15)

<u>සිංහල භාෂාව හා සාහිත්‍ය</u>
<u>III පත්‍රය.</u>
<u>පිළිතුරු පත්‍රය.</u>

1.

(i). (අ) - සද්ධර්මරත්නාවලිය
(ආ) - දඹදෙණි යුගය

(ii). (අ) - කුරක්කන් කවි / කුරහන් කවි
(ආ) - උපදේශ කාව්‍යය / උපදෙස් කවි

(iii). (අ) පිං ඇති පරපව් වරමක් දෙන්නේ
(ආ) ශෛලිගත

(iv).(අ) සිංහල ෂෙලි
(ආ) තාගෝර්තුමාගෙන්

(v). (අ) ජාතකට්ඨ කතාව
(ආ) තලතා දේවි

(vi). (අ) වායු ගණය
(ආ) පිල්බරගණ, මොනරු

(vii) (අ) අංගුලිමාල
(ආ) පුරිසදම්මසාරථී ගුණය

(viii). (අ) රනේ යට'ග සැවිලිඳු දද ගළපාය
(ආ) අනේ ලකර කළ පුර අප නරපාය

(ix). (අ) ඒ.පී. ගුණරත්න
(ආ) ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයා / සිවිල් සේවා නිලධාරියකු

(x). (අ) ඔවා මුතු
(ආ) තුංමං හන්දිය

2. (i) (අ) වුලනී බ්‍රහ්මදත්ත රජුගේ සේනාව මියුලු නුවර වැටලූ අවස්ථාව
(ආ) රත්තරන් හා රිදී ආදියෙන් (ii) බබළන /දිදුලන
(ii) (අ) වෙහෙර / විහාරය/ කැරගල විහාරය
(ආ) හංසයා
(iii) (අ) අංගුලිමාල / අහුල්මල්
(ආ) අමාවතුර
(iv) (අ) හිරපල්ලා
(ආ) නම ස්වාමියා වූ බවුන් ජීවතුන් අතර සිටී ද යන්න දැන ගැනීමට
(v) (අ) සිංහබාහුට
(ආ) පියතුමාගේ අණ ඉක්මවා කටයුතු කිරීම

(ල. 4 x5=20)

3. (i) <u>හැඟීම් වලට වහල් වීම</u>
- .....ඒ විද්දත් දුවගේ භාවභාව ලීලා හෙවත් ඉඟි බිඟි දැක වාගෝධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නිසා යැයි නොසිතා....
- ..ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි. පිතා ගෙන නො කා නො බී හැඳට නැඟිලා වැද හොක්කා හ. .....
- .....එසේ වී නම් මම උන් හා එක් වෙමියි කියාලා. .....
- .....නැයන් සියන් ඥාතියෙක් ලෙසින් නැවතුවත් සිතා ගත් සිතුවිල්ල පිරිමැසූ මුත්. .....

ආදී යෝග්‍ය උදාහරණ දක්වා ,ඒවා විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.

(ii) <u>අනියෝග ජය ගැනීම</u>
- ...ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි මයිල ණුවන් කරා ගොසින් තමන් සමර්ථ නෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන. ....
- කෙළි ලළ බලන්ට රැස්වුවන් කොක්සත් ගසන නියාවන් ඇතිලි පැ තිනි කොට ලා හුණදඩු අග සිට ලා දකින්ම සිස් අහසට පත් විටක් පෙත්තක් මෙන් සිසාරී ලා.....
- ....හුණදඩු අතින් අහසට නැඟිලා තුදුස් විටක් විවර අහස සිපැරි පියා බැස ලා හුණදඩු අග දී පිළිසිඹියා පත් රහත් ව.....

නැතහොත්

(i). <u>ශබ්ද රසය ඉස්මතු වන භාෂා භාවිතය</u>
- සුර රද සමන් සමඟින් සුරභන එවර...
- සන්නන් සිහින් ගෙදි සෙවණැලු වැලි තෙලෙන...
- වලදින අඳහසින් මෙන් සුර ගහ අහන
- අග පිපි මල් මලිගිය ලිය කැලේයා

ආදී ශබ්ද රසය ඉස්මතු කරන යෝග්‍ය යෙදුම් පිළිබඳ උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.

(ii). <u>ස්වභාවෝක්ති වර්ණනා</u>
- අග පිපි මල් මලිගිය ලිය කැලේයා.....
- කස්තුරි තිලක දී නළලත පුමටාන.....
- රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී.....
- මහ නිලමින් සිටි නා දොඹ නී පියල.....

ආදී යෝග්‍ය උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.

4.

(i). <u>ස්වභාව ධර්මයේ පීඩාව</u>

- අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි..
- ඒකාකාරී ජීවිතයත් දැඩි උණුසුම් වාතය සමඟ කෙළවරක් නැති ගසුත් කෙළවරක් නැති තණතටලුත් හමුවේ ඔවුන්ගේ කල්පනා ශක්තියත් වේදනා ශක්තියත් මිලිනව මිය යන්නේය.

.....

(ii). <u>නීතියේ අසාධාරණත්වය ප්‍රකට වන අවස්ථා</u>

- " කවදාවත් මිනිහෙක් ඔහෙන් එළියට එන්නේ නෑ - නොහොම ද මිනිහෙක් ඔක ඇතුලෙ ජීවත්වෙන්නෙ.හැම තිස්සෙම ගිත්තිවිලින් වට කරගන "
- ඔහුට ගිය මිනිහෙක් කවදාවත් එළියට එන්නේ නෑ. ආදී ප්‍රකාශ මඟින් නීතියේ අසාධාරණත්වය ප්‍රකාශ වීම.
- නොකළ වරදකට සිරගත වූ මිනිසකුගේ ජීවිතය කතුවරයා ග්‍රහණය කර දැති ආකාරය."ඒක බොරු නඩුවක් ආරච්චිගේ ගේ බින්දයි කියලා"

" එයා මේ හිර ගෙදර එව්වා, මාස ගණනකට ඉස්සර, ඒක බොරු නඩුවක්. එයා මාස හයකට හිරේට නියම වුණා. දැන් මාස හය පහුවෙලා. ඒත් එයා ගමට ආවේ නෑ. මම මේ බොහොම දුර ඉඳලයි ආවේ. මට බොහොම මහන්සියි. පියේ මම බොහොම කරදර විඳගෙන ආවේ එයා බොයාගන්න"

ආදී ප්‍රකාශ මඟින් නීතියේ අසාධාරණත්වය අබිමුව ගැහැනිය පීඩාකාරී ඉරණමකට ගොදුරුවන ආකාරය නවකතාවෙන් නිරූපිතය.

මුදල් ආදිය ඔහ දුප්පත් පුද්ගලයින්ට නීතියේ සාධාරණත්වය ලබා ගැනීම දුෂ්කර බව පහත උද්ධෘත වලින් ප්‍රකට වේ.

" ඔව් එයත් මෙහෙ හිටියා. උඹ ළඟ පල්ලි හෙම නියනවා ද ගැනියේ ?නෑ අපියා, සතයක්වත් නෑ අපි බොහොම දුප්පත් මිනිස්සු "

" ආ, එහෙනම් අපට බෑ මෙහි දී මොකුත් කියන්ඩ.උඹ කඹුරුපිටියට ගිහින් ඒජන්ත හාමුදුරුවන්ට පෙත්සමක් දිපන්... "

ස්වභාව ධර්මයේ පීඩාවට හා නීතියේ අසාධාරණත්වය හමුවේ ගැහැනියක් මුහුණ දුන් සිද්ධි හා අවස්ථා දැසුරෙන් .....කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

නැතහොත්

(i). <u>පාර්ථක කාව්‍යමය භාෂාවක් උපයුක්ත කොට ගැනීම පදහා නිදසුන්</u>

- ගමේ මුල් ළදරු අවස්ථාව සිහිපත් කරන කාව්‍යමය භාෂා භාවිතය
  උදා :- කඳු බැවුමක දෑ බෝවිටි පඳුරු තළා....
- ගඟ යුවනියක මෙන් ගමන් ගන්නා අයුරු අපූර්වාකාරයෙන් ග්‍රහණය කර තිබීම.
  උදා :- සැහෙවෙමි එමෙමි නිසසල වෙමි සසල වෙමි.....
- අනාගත සුන්දර අපේක්ෂා ධ්වනිතාර්ථවත් වදන් මඟින් දැක්වීම
  උදා :- රන්තරු පිරිවරා ගත් සඳ මඩල යට.....

ආදී යෝග්‍ය උදාහරණ දෙක බැඟින් දක්වමින් විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.

(ii). <u>ජීවන යථාර්ථය</u>

- යුවනිය ද ගඟ මෙන් ජීවන බර බෙදා හදා ගැනීම
  උදා :- කවදා කොතැනකදී හෝ මහ මුහුදු හිමි.....
- ජීවිතයෙහි කටුකත්වය මතින් සුන්දරත්වය දැකීම.
  උදා:- පුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු දියේ .....
- ජීවිතයේ සුන්දරත්වය විඳිය හැක්කේ අභියෝග මතින් බව
  උදා:- සම් තැනිතලාවල හමුවෙයි අලසකම
  නීරපපි අතරමඟ අවහිර තුදුවූ කිම

ආදී වශයෙන් ජීවන යථාර්ථය පිළිබිඹු කර ඇති අවස්ථා උදාහරණ ලෙස දක්වා තිබීම ප්‍රමාණවත් ය.

(5). අතීත ශ්‍රී විභූතිය ඔස්සේ සමෘද්ධිමත් හෙට දිනක් පිළිබඳ අපේක්ෂා දැල්වීම, කාව්‍යාත්මක ලෙස .....කර ඇති අවස්ථා සඳහන් කොට දැක්විය යුතු ය.

- දැතේ කරගැට සිඹ සතසන්නට
  ළා ගොයමේ දළු පවන් පලයි....
- දහදිය මුතු ඇට මල් වරුසා වී
  කරල් බරින් පීදී වැඟිරෙයි....
- දහපත් වැඩි බැදි යෝධ මිනිස් කැල
  යළි ඉපදී ඇති මවු දෙරණේ....
- හෙට ඉදිවන නව ලෝකය දැක දැක
  පුංචි පුනා හීනෙන් හිනැහෙයි
- ණය නැති බිය නැති නිවහල් යුගයක
  පුංචි පුනා රජ කරනු පෙනේ.

ආදී පද්‍ය පාය උපුටා දක්වමින් විස්තර කර තිබීම යෝග්‍ය වේ. උදාහරණ තුනක් වත් දැක්විය යුතුය.

(6). යහපත් සෞම්‍ය පුරුදු ප්‍රවලිත කිරීම සඳහා නිලධාරීන්ට දැරීමට සිදු වන වෙහෙස, භාෂාය හා උපභාසයෙන් යුතුව මෙවැනි කතාව ඇසුරින් ඉදිරිපත් කිරීම යෝග්‍ය වේ.

- දැනුවත් කිරීම්වලට යාමේ දී තුනුරු අන්දැකීම්වලට මුහුණ දීමට සිදු වීම.
  උදා :- ඔහු බර සපත්තු දැමූ පය ඒ මන තබා තද කොට බැලීය. ඒදණ්ඩ නොසැලී පිටි නමුත් ඔහුගේ පය බදා ගත්තේ නැත.....

- නැවත නැවතත් ගැමියන් වෙත ගොස් වැසිකිළි තැනීමට උනන්දු කිරීමට සිදු විය.
  උදා :- " ලෑල්ල දාම්මාට වැසිකිළියක් හැදෙනවා ද මිනිහෝ? සුමාන දෙකකින් හදනව කියලා නේද එදා පොරොන්දු වුණේ? දැන් සුමාන දෙක නෙවෙයි, මාස දෙකකටත් වැඩිය ඇති "

- වචන වරදවා ගැනීමෙන් ගැමියන්ගේ භාෂායට ලක් වීම.
  උදා :- " කුණු ඉස්පැට්ටර නිකෝනිස්කාරයාගෙ ගෙදෙට්ට ගිහින් ඇහැව්වලු 'කක්කුස්සියක් නියනවද?' කියල. " සුගතත් පටන් ගත්තේ ය.
  " නිකෝනිස් කිව්වලු අනේ බුදු මහත්තයෝ මෙහෙ මොන කක්කුස්සිද ? ඔන්න ඔතනින් ඔය බැද්දට පාත් වෙන්න...."

- ගැමියන්ගේ දෝෂාරෝපණයට ලක් වීමට සිදු වීම.
  උදා :- " උන්ට නම් මොකෝ .... ආංඩුවෙන් පඩි තකා කියාවි. ඕන් හදපං නැත්නම් නඩු දානවා කියලා. දුප්පත් අපි නම නැහෙන්නේ "

- නිලධාරීන්ට උපහාසාත්මක නම් පට බැඳීම.
  උදා:- " කුණු ඉස්පැට්ටර ! සුගතත් තම හඳුනා ගැනීම පිළිබඳ ගර්වයෙන් යුතුව කිය..."

යෝග්‍ය උදාහරණ තුනක් වත් දක්වා තිබීම ප්‍රමාණවත්.

(7). රසික සිත් ප්‍රබෝධවත් වන පරිදි සුරඟන රැඟුම් අවස්ථා නිරූපණය.

උදා:- (i) වීණා නාදය අනුව ම පා තබමින් නැටීම

රන් රසේ එක් වන ලලසේ වෙණ - නාදනු පා තබ තබා

(ii) නරඹන්නන් ප්‍රබෝධවත් වන පරිදි සභාව දෙස බලමින් රංගනයේ යෙදීම

උදා :- කම්පසේ දෙන සැර ලෙසේ දෙස - බල බලා නෙකඟින් සබා

(iii) රංගනයට උචිත ලෙස සිත් ගන්නා අයුරින් සැරසී නර්තනයේ යෙදීම.

උදා :- පුන් මදාරා මල්දමින් මුදු - දිගු සුනිල් වරලස ගොතා

මන් මිදා කිතු ලිය ලෙසින් උර - තුර සරා දිලි මුතු ලතා

(iv) නර්තනය හා වාදනය මැනවින් සුසංයෝජනය වී නිරෙකා ආකාරය

උදා :- මන් නදා වන මිණි මෙවුල් නද

වෙණ නදින් එක් කොට ඉතා

උන් එදා දුන් රඟ දුටාත් සව

සක් පැපක් කවරෙක් පතා

ආදී යෝග්‍ය උදාහරණ කුනක්වත් දක්වා තිබීම ප්‍රමාණවත්.